# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,370 - 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා - 2024.02.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 148 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 152 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 පෙබරවාරි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## මහනුවර මහා නගර සභාව

ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරිය) අංක 17(1) දරන වගන්තිය යටතේ මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව මහනුවර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් හා මහනුවර මහා නගර සභාවේ බලතල හා කර්තව්‍යයන් ඉටුකිරීමේ නිලධාරී වන කාරියවසම් කටුකොහිළ ගමගේ ඉෂාන් ධම්මික ප්‍රසාද් විජේතිලක වන මා විසින් 2024 වර්ෂය තුළ මහනුවර මහා නගර සීමාව තුල මෙහි පහත පළමුවැනි උපලේඛනයෙහි හා දෙවන උපලේඛනයෙහි සඳහන් දිනයන්හි දී ද විශේෂ හේතුවක් මත රජය විසින් හා මා විසින් නියෝග කරනු ලබන වෙනත් දිනයන්හිදී ද මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම, මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සම්පූර්ණයෙන් තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

ඉෂාන් විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2024 ජනවාරි මස 24 වැනි දින,
මහ නගර සභාව,
මහනුවර.

### පළමුවැනි උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 25 බ්‍රහස්පතින්දා | - | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| පෙබරවාරි | 23 සිකුරාදා | - | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| මාර්තු | 24 ඉරිදා | - | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| අප්‍රේල් | 23 අඟහරුවාදා | - | බක් පුර පසළොස්වක පෝය දිනය |
| මැයි | 23 බ්‍රහස්පතින්දා | - | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| මැයි | 24 සිකුරාදා | - | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| ජූනි | 21 සිකුරාදා | - | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| ජූලි | 20 සෙනසුරාදා | - | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| අගෝස්තු | 19 සඳුදා | - | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| සැප්තැම්බර් | 17 අඟහරුවාදා | - | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| ඔක්තෝබර් | 17 බ්‍රහස්පතින්දා | - | වප් පුර පසළොස්වක පෝය දිනය |
| නොවැම්බර් | 15 සිකුරාදා | - | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| දෙසැම්බර් | 14 සෙනසුරාදා | - | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

### දෙවැනි උපලේඛනය

වර්ෂය තුළ සෑම මසක ම ඉරිද සහ පහත සඳහන් ප්‍රසිද්ධ නිවාඩු දිනයන්වල දී හා මීට අමතරව විශේෂ හේතුවක් මත රජය විසින් හා මා විසින් නියෝග කරනු ලබන වෙනත් දිනයන්වලදී.

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 15 සඳුදා | - | දෙමළ තෛපොංගල් දිනය |
| පෙබරවාරි | 04 ඉරිදා | - | ජාතික නිදහස් සමරු දිනය |
| මාර්තු | 08 සෙනසුරාදා | - | මහා සිවරාත්‍රී දිනය |
| මාර්තු | 29 සිකුරාදා | - | මහා සිකුරාද දිනය |
| අප්‍රේල් | 11 බ්‍රහස්පතින්දා | - | ඊදුල් ෆීතර් (රාමසාන් දිනය) |
| අප්‍රේල් | 12 සිකුරාදා | - | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනයට පෙර දිනය |
| අප්‍රේල් | 13 සෙනසුරාදා | - | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| මැයි | 01 බදාදා | - | කම්කරු දිනය |
| ජූනි | 17 සඳුදා | - | ඊදුල් - අල්හා (හජ්ජි උත්සවය) |
| සැප්තැම්බර් | 16 සඳුදා | - | නබි නායකතුමාගේ උපන් දිනය |
| ඔක්තෝබර් | 04 සිකුරාදා | - | ලෝක සත්ව දිනය |
| ඔක්තෝබර් | 31 බ්‍රහස්පතින්දා | - | දීපවාලී උත්සව දිනය |
| දෙසැම්බර් | 25 බදාදා | - | නත්තල් උත්සව දිනය |

02-58

**මහව ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයන් හි ගෝඝාතකාගාර පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත දන්වා එවිය යුතු බව, ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරයේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් ලැබේ.

ආර්. ඩී. කේ. අමරජීව,
ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මහව ප්‍රාදේශීය සභාව.

2024 ජනවාරි මස 22 වැනි දින,
මහව ප්‍රාදේශීය සභාව,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය 01**

| *අනු අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *බලපත්‍ර වලංගු කාල සීමා* |
|---|---|---|---|
| 01 | කේ. ජී. මංජුල ප්‍රියදර්ශන | පහළවත්ත, අඹන්පොළ | 2024.02.15 සිට 2024.12.31 දක්වා |

02-52

---

**බේරුවල ප්‍රාදේශීය සභාව**

මාර්ග - නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උපකාර්යාල බල ප්‍රදේශයට අයත් පහත උපලේඛනයේ විස්තර කර ඇති මාර්ගය "රණවිරු ලාන්ස් කෝප්‍රල් එච්. ඩී. එස්. සම්පත් ප්‍රනාන්දු මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ 2022.04.19 දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක ඊ.1.59 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් එම මාර්ගය 2023.11.08 දින සිට "රණවිරු ලාන්ස් කෝප්‍රල් එච්. ඩී. එස්. සම්පත් ප්‍රනාන්දු මාවත" යනුවෙන් නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

අශෝක රණසිංහ,
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බේරුවල ප්‍රාදේශීය සභාවේ
බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 ජනවාරි මස 22 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

1. පළාත් පාලන ආයතනයේ නම : බේරුවල ප්‍රාදේශීය සභාව
2. දිස්ත්‍රික්කය : කළුතර
3. ප්‍රා. ලේ. කොට්ඨාශය : බේරුවල
4. දැනට භාවිත වන නම : මග්ගොන මාගල්කන්ද රොක්ලන්ඩ් හන්දියේ සිට මාගල්කන්ද ගම්මානයට පිවිසෙන මාර්ගය
5. මාර්ගයේ ආරම්භය : මග්ගොන මාගල්කන්ද රොක්ලන්ඩ් හන්දියේ සිට
6. මාර්ගයේ අවසානය : මාගල්කන්ද ගම්මානයට පිවිසෙන මාර්ගය
7. අලුතින් යොදා ඇති නම : "රණවිරු ලාන්ස් කෝප්‍රල් එච්. ඩී. එස්. සම්පත් ප්‍රනාන්දු මාවත"

02-78

## ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134(1) උපවගන්තියෙන් නියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස විසිතුන් වන දින තීරණ අංක 2023/10/23/175 යටතේ තීරණය කෙරුණු පහත තීරණයට එකී පනතේ 134 (1) උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ නැමැති මවිසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස්/
නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් - ගාල්ල.

2023 දෙසැම්බර් මස 11 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව, නියාගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව, නියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි 30 ඩී කරව්ව ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා 30 ඊ කළුආරච්චිගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමටත් උක්ත ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි.

02-38

---

## ඉපලෝගම ප්‍රාදේශීය සභාව

### ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් සඳහා

ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන ලේකම් වන ඩබ්. එම්. ඩබ්. කුමාරි විජේසිංහ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් සඳහා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර විධානය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඩබ්. කුමාරි විජේසිංහ,
ලේකම්,
බලතල ක්‍රියාත්මත කරන කාර්යය,
කර්තව්‍ය ඉටු කරන නිලධාරි,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව.

02-36/1

---

## ආණ්ඩුකාරවර කාර්යාලය - උතුරුමැද පළාත, අනුරාධපුරය

### විෂය භාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටු කරන ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අළුත් තක්සේරුවක් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තිය ප්‍රකාරව ඉපලෝගම බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අළුත් තක්සේරුවක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත්

ගරු ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අළුත් තක්සේරුවක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරුමැද පළාත,
අනුරාධපුර.

02-36/2

---

**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**

ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත, වරිපනම් බදු ප්‍රතිශතය නිවේදනය කිරීම

ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ ලේකම් බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි ඩබ්. එම්. ඩබ්. කුමාරි විජේසිංහ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීමට උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඩබ්. කුමාරි විජේසිංහ,
ලේකම්,
බලතල ක්‍රියාත්මත කරන කාර්යය,
කර්තව්‍ය ඉටු කරන නිලධාරි,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව.

02-36/3

---

**උඩුනුවර ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (271 වැනි අධිකාරිය)

මෙහි පහත දැක්වෙන විස්තර සඳහන් ස්ථානයන්හි ගවමස් වෙළඳාම් කිරීම සඳහා 2024 වර්ෂයට බලපත්‍ර ලබාදෙන ලෙසට ඉල්ලීම් කර ඇති බවට ගෝ ඝාතක ආඥාපනත 7(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍ර ලබා දීමට විරෝධතාවයන් පවතී නම් උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ඕනෑම අයෙකුට විරෝධතා ඉදිරිපත් කළ හැකිය. එම විරෝධතා වලට හේතු සහිතව පිටපත් 02 කින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් (දින දහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙසට මෙයින් කාරුණිකව දන්වමි.

| | *නම හා ලිපිනය* | *වෙළඳ ස්ථානයේ ලිපිනය* | *වෙළඳාම් කරන මස් වර්ගය* |
|---|---|---|---|
| 01. | එම්. එෆ්. එම්. සියාත් මයා,<br>අංක 07/බී, දෙඹගොල්ල, මුරුතගමුල | අංක 383, හකුරංගේවත්ත, බූවැලිකඩ | ගවමස් |
| 02. | එම්. ෆාරුක් මොහොමඩ් සාදික් මයා,<br>528/2, නව ඇල්පිටිය, ගෙලිඔය | අංක 6B, කළුගමුව පාර, ගෙලිඔය | ගවමස් |

එස්. කේ. ගුණසේකර,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2024 ජනවාරි මස 22 වැනි දින.

02-77

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## පේදුරුතුඩුව නගර සභාව

### 2024 වර්ෂය සඳහා වන අයවැය ලේඛනයේ සංක්ෂේපය

2024 වර්ෂය සඳහා වන අයවැය ලේඛනයේ සංක්ෂේපය 1939 වර්ෂයේ අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 178(1) වන වගන්තිය ප්‍රකාරව පේදුරුතුඩුව නගර සභාව විසින් සකස් කර ඇත. 2023.12.18 දිනැති පරිපාලන නියෝග අංක 236/2023 ප්‍රකාරව එය අනුමත කර ඇති බව මහජනතාව වෙත මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මුළු ලැබීම් ප්‍රමාණය : රුපියල් 153,074,125.00

මුළු වැය ප්‍රමාණය : රුපියල් 153,069,555.00

සභාවේ මූල්‍ය ආදයම : රුපියල් 4,570.00

| *ව්‍යාපෘති* | *ආදායම* | | | *වියදම* | | |
|---|---|---|---|---|---|---|
| | *පුනරාවර්තන ආදායම රු. ශත* | *ප්‍රාග්ධන ආදායම රු. ශත* | *මුළු මුදල රු. ශත* | *පුනරාවර්තන වියදම රු. ශත* | *ප්‍රාග්ධන වියදම රු. ශත* | *මුළු මුදල රු. ශත* |
| 01. සාමාන්‍ය පරිපාලනය | 84,461,190.00 | 76,000.00 | 84,537,190.00 | 48,074,920.00 | 2,901,000.00 | 50,975,920.00 |
| 02. සෞඛ්‍ය සේවා | 30,473,695.00 | 1,000.00 | 30,474,695.00 | 50,763,695.00 | 1,117,000.00 | 51,880,695.00 |
| 03. භෞතික සැලසුම් | 14,701,880.00 | 4,000.00 | 14,705.880.00 | 17,485,080.00 | 15,754,000.00 | 33,239,080.00 |
| 04. ජල සේවා | 473,000.00 | 1,000.00 | 474,000.00 | 251,000.00 | 1,000.00 | 252,000.00 |
| 05. උපයෝගිතා සේවා | 19,881,600.00 | 1,000.00 | 19,882,600.00 | 3,092,600.00 | 311,000.00 | 3,403,600.00 |
| 06. සුබ සාධක සේවා | 2,998,760.00 | 1,000.00 | 2,999,760.00 | 5,817,260.00 | 7,501,000.00 | 13,318,260.00 |
| | 152,990,125.00 | 84,000.00 | 153,074,125.00 | 125,484,555.00 | 27,585,000.00 | 153,069,555.00 |

තාරණී කජරූබන්,
ලේකම්,
පේදුරුතුඩුව නගර සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
විද්‍යාල පාර,
පේදුරුතුඩුව.

02-37

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **පෙබරවාරි** | 2024.02.02 | සිකුරාදා | 2024.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.09 | සිකුරාදා | 2024.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.16 | සිකුරාදා | 2024.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.22 | බ්‍රහස්පතින්දා | 2024.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2024.03.01 | සිකුරාදා | 2024.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.07 | බ්‍රහස්පතින්දා | 2024.02.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.15 | සිකුරාදා | 2024.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.22 | සිකුරාදා | 2024.03.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.28 | බ්‍රහස්පතින්දා | 2024.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.